# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

### සමාජ විද්‍යාව (නව/පැරණි නිර්දේශය)

### සමාජ පර්යේෂණ ක්‍රම SOCI – E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. පර්යේෂණයක් යනු කුමක්දැයි නිර්වචන ඔස්සේ පැහැදිලි කර න්‍යාය සහ පර්යේෂණ අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න.

02. නූතන අවශ්‍යතාවන්ට අනුව පර්යේෂණ වර්ග කර ගුණාත්මක පර්යේෂණ සහ ප්‍රමාණාත්මක පර්යේෂණ අතර ඇති වෙනස පෙන්වා දෙන්න.

03. "පර්යේෂණයක දී දත්තවල ස්වභාවය සහ දත්ත විශ්ලේෂණයේ ස්වභාවය තීරණය වන්නේ භාවිතා කරන පර්යේෂණ ක්‍රම මතය." ඔබ මෙම කියමනට එකඟ වන්නේද? පර්යේෂණ ක්‍රම ගැන විශේෂ අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

04. පර්යේෂණ සැලැස්මක් පිළියෙල කිරීමේ දී සාහිත්‍ය විමර්ශනය කෙතරම් වැදගත් දැයි සාහිත්‍ය විමර්ශනය කල යුතු ආකාරය අනුව පැහැදිලි කරන්න.

05. ප්‍රධාන නියැදි ක්‍රම සහ නියැදි වර්ග පිළිවෙලින් උදාහරණ ගෙනහැර දක්වමින් පැහැදිලි කරන්න.

06. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමයක් ලෙස ස්ථාවර ප්‍රභේද පිළිතුරු සහිත ප්‍රශ්නාවලියක් සකස් කරන්නේ කෙසේද? ඔබ කැමති ක්ෂේත්‍ර පර්යේෂණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

07. දත්ත විශ්ලේෂණයේ දී ඒක විචල්‍ය විශ්ලේෂණය, ද්විත්ව විචල්‍ය විශ්ලේෂණය සහ බහු විචල්‍ය විශ්ලේෂණය අතර ඇති වෙනස්කම් මොනවාදැයි විග්‍රහ කරන්න.

08. පහත මාතෘකා අතරින් දෙකක් ගැන විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

   a. පර්යේෂණ ආචාර ධර්මවල වැදගත්කම
   b. පර්යේෂණ වාර්තාවක මූලිකාංග
   c. දත්තවල වලංගුභාවය
   d. සහභාගිත්ව නිරීක්ෂණය උපයෝගී කරගන්නා අන්දම

********************************